# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1890/32 - 2014 නොවැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2014.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා දැන්වීම්

### උතුරු පළාතේ පළාත් සභාව

2014 වර්ෂයේ අංක 02 දරන උතුරු පළාතේ පළාත් සභාවේ මුද්දර බදු හුවමාරු කිරීමේ ප්‍රඥප්තිය

උතුරු පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය, මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වන කනගසබාපති විශ්වලිංගම් විග්නේෂ්වරන් වන මම උතුරු පළාතේ පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල වලට අනුව 2014 වර්ෂයේ අංක 02 දරන උතුරු පළාතේ පළාත් සභාවේ මුද්දර බදු හුවමාරු කිරීමේ ප්‍රඥප්තිය සම්පූර්ණයෙන්ම මහජනතාවගේ දැනගැනීම සඳහා මෙය ප්‍රකාශයට පත්කරමි. මෙම ප්‍රඥප්තිය 2014 අගෝස්තු මස 05 වැනි දින උතුරු පළාත් සභාව විසින් සම්මත කරන ලද බවත්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය 2014 සැප්තැම්බර් මස 17 වැනි දින ලැබී ඇති බවත්, 2014 නොවැම්බර් මස 10 වැනි දින සිට ක්‍රියාත්මක වීමට නියමිත බවත් මෙමඟින් දන්වා සිටිනු ලැබේ.

ක. වි. විග්නේෂ්වරන්,
ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය සහ සාමය,
ඉඩම්, මාර්ග සංවර්ධන, විදුලි බල, නිවාස සහ ඉදිකිරීම්, ජල සැපයුම්,
සමුපකාර සංවර්ධන, සමාජ සේවා, පුනරුත්ථාපන, කාන්තා කටයුතු,
කර්මාන්ත සහ ආයෝජන ප්‍රවර්ධන, පරිසර, පළාත් පාලන හා පළාත් පරිපාලන,
ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය.
උතුරු පළාත් සභාව.

2014 නොවැම්බර් මස 19 වන දින,
අංක 26, සෝමසුන්දරම් ඇවනියු,
යාපනය,
ප්‍රධාන අමාත්‍ය මහ ලේකම් කාර්යාලයේ දී ය.


1A - PG 2260 — 25 (2014/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාත් මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය**

වර්ෂ 2014 අංක 01 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුව රැස්කරන ලද මුද්දර ගාස්තු උතුරු පළාත් පාලන ආයතනවලට හුවමාරු කිරීම, පරිපාලන වියදම් පළාත් අරමුදලට අයකිරීම හා ඊට ආනුෂාංගික වන කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ප්‍රඥප්තියකි.

උතුරු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ප්‍රහුඛ නාමය

01. මෙම ප්‍රඥප්තිය "වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාත් මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වන්නේ ය.

මුද්දර ගාස්තු හැරවීම

02. (1) උතුරු පළාතේ වර්ෂ 2014 අංක 01 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව උතුරු පළාතේ කිසියම් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් තුළ පිහිටා තිබෙන යම් නිශ්චල දේපළක් හුවමාරු කිරීම සම්බන්ධයෙන් වූ සාධන පත්‍රයන් වෙනුවෙන් පළාත් සභාව කිසියම් මුද්දර ගාස්තුවක් (මින් මතුවට ගාස්තුවක්) අයකර, රැස්කර, පළාත් අරමුදලට ගෙවා ඇති විටෙක, එකී ගාස්තු අදාළ වර්ෂයට පසු වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට අවුරුදු 02ක කාලසීමාවක් තුළ අමාත්‍යවරයාට, මින් මතුවට විස්තර කරන්නා වූ විධිවිධාන වලට යටත් ව, මෙම ප්‍රඥප්තියේ ඇමුණුම 01 හි සඳහන් ඉල්ලුම් පත්‍රය අනුව, එකී පළාත් පාලන ආයතනවල පරිපාලන නිලධාරියෙකුගේ ලිඛිත ඉල්ලීමක් මත, කිනම් බල ප්‍රදේශයක තුළ පිහිටා තිබෙන පළාත් පාලන ආයතනයක යම් නිශ්චල දේපළක් මත එකී ගාස්තු රැස්කර, භාණ්ඩාගාරයට ගෙවනු ලැබුවේ ද, එවැනි ගාස්තු එම පළාත් පාලන ආයතනයට, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව පළාත් අරමුදලෙන් හැරවීම කරගත යුතු වන්නේ ය.

නොඉල්ලූ ගාස්තු පළාත් සභා අරමුදලට මාරු කිරීම

(2) (1) උපවගන්තියෙහි දැක්වෙන කාලසීමාව තුළ එකී පළාත් පාලන ආයතනයේ හෝ ආයතන වලින් නොඉල්ලූ මුද්දර ගාස්තු එහි සඳහන් අවුරුදු දෙකක (02) කාලසීමාව අවසන් වී ඊළඟ වර්ෂයේ ජනවාරි මස පළමු වැනිදා සිට එකී ගාස්තු පළාත් අරමුදලට මාරු කළයුතු වන්නේ ය.

කෙසේ වෙතත් කිනම් පළාත් පාලන ආයතනයකට අදාළ එකී ගාස්තු පළාත් අරමුදලට මාරු කරනු ලැබුවේ ද, එකී පළාත් පාලන ආයතනය, කල් ඉකුත් වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් හේතු සහිතව ප්‍රමාද ඉල්ලුම් පත්‍රයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන විටක, අමාත්‍යවරයා එම ඉල්ලුම් පත්‍රය ගැන සලකා බලා සෑහීමකට පත්වන්නේ නම්, (1) වන උපවගන්තියෙහි පෙන්නුම් කරන ලද, එකී පළාත් පාලන ආයතනයට අදාළ ගාස්තු පළාත් අරමුදලින් හැරවීම කළයුතු වන්නේ ය.

01%කට සමාන ගාස්තු ප්‍රමාණයක් පරිපාලන වියදම් වශයෙන් පළාත් අරමුදලට බැර කිරීම

(3) එකී ගාස්තු එම පළාත් පාලන ආයතනයට (1) වන උප වගන්තිය යටතේ මාරු කරනු ලබන විට, පළාත් සභාව එම පළාත් පාලන ආයතනයට හරවන එකී මුදලින් 01% කට සමාන මුදලක්, ගාස්තු රැස්කිරීම සම්බන්ධයෙන් පළාත් සභාවේ පරිපාලන වියදම් වශයෙන්, පළාත් අරමුදලට බැරකර, ඉතිරි මුදල අදාළ පළාත් පාලන ආයතනයට හැරවීම කළයුතු වන්නේ ය.

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය

03. කිසියම් පළාත් පාලන ආයතනයක් 02 වන වගන්තියේ හා (1) වන හා (2) වන උපවගන්ති යටතේ වූ ඉල්ලුම්පත්‍රයක්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු වෙනුවට ඔහු විසින් නම් කර, පත්කරනු ලබන්නාවූ වෙනත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද, ඇමුණුම් - II හි ආදර්ශය අනුව සකස් කරන ලද උපලේඛනයක් සමගින් ඉදිරිපත් කරන්නේ නම්, එම ඉල්ලුම් පත්‍රය වලංගු විය යුතුය.

අර්ථ නිරූපනය

04. මෙම ප්‍රඥප්තියේ අවස්ථා වෙනත් අයුරකින් භාවිතා කළහොත් මිස,

"අමාත්‍යවරයා" යනු උතුරු පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා වන්නේ ය.

"පළාත් පාලන ආයතනය" යනු කිසියම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් කරන අතර, එවැනි සභාවක සිදුකරන ලද හා ඉටුකරන ලද යුතුකම් හා කාර්ය භාරයන්ට අනුරූපී හෝ සමාන, යුතුකම් හා කාර්ය භාරයන් කිරීමට, සිදුකිරීමට හා ඉටුකිරීමට හෝ වෙනත් පනතකින් හෝ පනත් යටතේ ඇති කරන ලද්දා වූ, ස්ථාපිත කරන ලද්දා වූ කිසියම් බලධාරියෙකුගෙන් ද සමන්විත වන්නේ ය.

"සාධන පත්‍රය" යනු වර්ෂ 2014 අංක 01 දරන පළාත් මුදල් ප්‍රඥප්තියේ විධිවිධාන සලසා ඇති එකී අර්ථ නිරූපනය වන්නේ ය.

"ගාස්තු" යනු වර්ෂ 2014 අංක 01 දරන පළාත් මුදල් ප්‍රඥප්තියේ XI වන පරිච්ඡේදයේ 35 වන වගන්තියේ (අ) කොටස යටතේ විධිවිධාන සලසා ඇති මුද්දර ගාස්තු වන්නේ ය.

"පරිපාලන නිලධාරී" යනු

(අ) මහ නගර සභාවක් නම්, මහ නගර සභා කොමසාරිස්වරයා ද,

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම්, එහි ලේකම්වරයා ද වන්නේ ය.

"පළාත් සභාව" යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154A(1) පරිච්ඡේදයේ විධිවිධාන වලට යටත් ව, ස්ථාපිත කරන ලද උතුරු පළාත් සභාව වන්නේ ය.

05. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර අනනුකූලතාවයක් ඇති වුවහොත් දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය. අනනුකූලතාවයක් ඇති වූ විට දෙමළ පාඨය බලපැවැත්විය යුතු බව

*2 (1) වගන්තිය* ඇමුණුම - 01.

*වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ*
*2 (1) වන වගන්තිය යටතේ විධිවිධාන අනුව ඉල්ලුම් පත්‍රය*

ගරු මුදල් ඇමතිතුමා,
උතුරු පළාත් සභාව.

වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ
2 (1) වන වගන්තිය යටතේ වූ විධිවිධාන වලට අනුව කරන ඉල්ලීම.

මහ නගර /නගර / ප්‍රාදේශීය සභාවේ නම : ..............................................................................................................

වර්ෂ ............... අංක ..................... දරන උතුරු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ .............................. වන වගන්තිය යටතේ වූ විධිවිධාන වලට අනුව,

.......................................................... මහ නගර / නගර / ප්‍රාදේශීය සභාවේ කොමසාරිස්වරයා/ලේකම්වරයා (මින් මතුවට පරිපාලන නිලධාරියා) වන මම, ඉහත මහ නගර / නගර / ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති නිශ්චල දේපළ හුවමාරු කිරීම සම්බන්ධයෙන් රැස්කරනු ලදුව උතුරු පළාත් අරමුදලට බැර කර ඇති මුද්දර ගාස්තු රුපියල් ..................................................................... (රුපියල් ..................................................................... ) මුදල ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය මෙයින් ඉදිරිපත් කරමි. මේ අනුව 20 ...................... වර්ෂයේ ....................................................... මාසය සඳහා අමුණා ඇති උපලේඛනයේ සඳහන් විස්තර අනුව, ඉහත කී රුපියල් ................................................ ක මුදල, ඉහත කී මහ නගර / නගර / ප්‍රාදේශීය සභාවට මාරු කරන ලෙස ඉල්ලා සිටිමි.

උප ලේඛනයේ දක්වා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් සහතික කරමි.

අත්සන :-..........................................................
නම :- .............................................................
(නිල මුද්‍රාව)
පරිපාලන නිලධාරි,
පළාත් පාලන ආයතනය.

දිනය :-........................................

*ඇමුණුම - II.*

*3 වන කොටස*

*වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ*
*03 වන වගන්තියට අනුව උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කළයුතු විස්තර සහිත උපලේඛනය*

ඉඩම් රෙජිස්ට්‍රාර් බල ප්‍රදේශය දිස්ත්‍රික්කය :- ..................................................

.................... වර්ෂයේ ......................... මාසය තුළ මහ නගර / නගර / ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ නිශ්චල දේපළ හුවමාරු කිරීමට අදාළව අයකළ මුද්දර ගාස්තු විස්තර :

| නොතාරිස්වරයාගේ නම | | සාධන පත්‍රයේ විස්තර | | | | මුද්දර ගාස්තු පිළිබඳ විස්තර | | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| අනු ක්‍රමික අංකය | නොතාරිස්වරයාගේ නම සහ අධිකරණ කොට්ඨාසය | අනුක්‍රමික අංකය | සාධන පත්‍රයේ අංකය | සාධන පත්‍ර ලියූ දිනය | සාධන පත්‍රයේ ස්වභාවය | ගෙවන ලද මුද්දර ගාස්තු | ගෙවීම් ආකාරය (ඇලවිය යුතු මුද්දර /බැංකු කුවිතාන්සිය) | සටහන |
| | | | | | | | | |
| | | | | | | | | |

i. මධ්‍යම ආණ්ඩුවේ මුද්දරයක් අලවා තිබෙන්නේ නම් “මධ්‍යම ආණ්ඩුව” ලෙස ද, නැතහොත් “පළාත් සභාව” සඳහා මුද්දරයක් හෝ සහතිකයක් අලවා තිබෙන්නේ නම්, එය කිනම් පළාත් සභාව සඳහා ද යන්න 09 වන තීරුවේ දැක්විය යුතු වන්නේ ය.

ii. කිසියම් බදු නිවසක සාධන පත්‍රයක් සහ උකසට තැබූ නිවසක සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වැරදි ආකාරයෙන් පළාත් සභා මුද්දරයක් / සහතිකයක් අලවා තිබෙන්නේ නම්, ඒ පිළිබඳ සියළු විස්තර ආකෘති පත්‍රයේ සඳහන් කළයුතු වන්නේ ය.

iii. 06 වන තීරුව යටතේ සාධන පත්‍රයේ මුල් පිටපතේ අලවා ඇති රුපියල් 01 ක වටිනාකමක් ඇති මුද්දර ගාස්තුව ද ඇතුළත් කර තිබෙන්නේ නම්, ඒ සම්බන්ධව වෙනත් යන තීරුව යටතේ සඳහන් කළ යුතු වන්නේය.

සකස් කළේ (නම) : ........................................................................ අත්සන : ........................................................................

පරීක්ෂා කළේ (නම) : ........................................................................ අත්සන : ........................................................................

........................................................................
රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා / ඔහු වෙනුවට,
ඔහු විසින් නම් කර, පත් කළ නිලධාරියා.

*වර්ෂ 2014 අංක 02 දරන උතුරු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තියේ*
*03 වන වගන්තිය යටතේ මුද්දර ගාස්තු අය කිරීම් පිළිබඳ ඉල්ලුම් පත්‍රය*

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් බලය පවරා ඇති ......................................................................... දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වන ......................................................................... මා විසින් සහතික කරනුයේ,

ඉහත සඳහන් මහ නගර / නගර / ප්‍රාදේශීය සභාව සඳහා වූ 20 .............................. වර්ෂයේ ..................................... මාසයේ ලිපිලේඛන ලියාපදිංචි ආඥාපනත (117 වන පරිච්ඡේදය) 5 (1) වගන්තිය අනුව මෙම කාර්යාලයේ ඉඩම් සාධන පත්‍ර වල අනුපිටපත් මා විසින් නිවැරදිව හා අවංකව පරීක්ෂා කිරීම මත මුද්දර ගාස්තු රුපියල් ............................................................ (රුපියල් ..................................................) වන අතර, නොතාරිස්වරයා විසින් සාක්ෂි දැරූ සාධන පත්‍ර කිසිවක් උපලේඛනයේ දෙවතාවක් සටහන් වී නොමැති බවත්, එම දේපළ පළාත් පාලන ආයතන දෙකකට අයත් උපලේඛන වල සටහන් වී නොමැති බවත්, එසේම උතුරු පළාත් සභාවෙන් නිකුත් කරන ලද මුද්දර / බැංකුවකින් නිකුත් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම් සහතික උපලේඛනයේ 07 වන තීරුවේ දක්වා ඇති බවත් ය.

අත්සන : .........................................................................
නම : ..............................................................................
(නිල මුද්‍රාව)

දිනය : .................................................
(රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි.)

ගරු මුදල් අමාත්‍යතුමා,
උතුරු පළාත.

අනු අත්සන සහිතව අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කෙරේ.

..........................................................................
(නිල මුද්‍රාව)
රෙජිස්ට්‍රාර්වරයා වෙනුවට.

දිනය : .................................................

රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලය/ලිපිනය.

12 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.